**රජයේ නිවේදන**

**සුරාබදු ආඥා පනත**

**අංක 03/2022 දරන සුරාබදු නිවේදනය**

**බෝතල් කරන ලද රා මත සුරාබද්ද**

කලින් කලට සංශෝධනය කරන ලද පරිදි සුරාබදු ආඥා පනතේ (52 වන අධිකාරය) 22 වැනි වගන්තියෙහි (1) වන උප වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල් අමාත්‍ය, එම්. යූ. එම්. අලි සබ්රි වන මම 2022 මැයි මස 04 වන දින සිට බලපැවැත්වෙන පරිදි;

(1) ශ්‍රී ලංකාවේ පිහිටුවන ලද බලපත්‍රලත් යම් නිෂ්පාදනාගාරයක නිපදවනු ලැබ, ඉන් නිකුත් කරනු ලබන්නා වූ බෝතල් කරන ලද රා ලීටරයක් වෙනුවෙන් රුපියල් පනහක් (රු. 50/-) වන බද්දක් අයවිය යුතු යැයි ද;

එසේ වුවද, ඉහත කී බෝතල් කරන ලද රා දිවයිනෙන් පිටතට අපනයනය කරනු ලබන කවර ප්‍රමාණයක් වෙනුවෙන් වුව ද එකී බද්ද අය නොකළ යුතු යැයි ද;

(2) 2021 ජනවාරි මස 07 වන දින අංක 2209/42 දරන අති විශෙෂ ගැසට් පත්‍රයෙහි පළකරනු ලැබූ අංක 03/2021 දරන සුරාබදු නිවේදනය මෙයින් අවලංගු විය යුතු යැයි ද;

නියම කරමි.

ජනාධිපති නීතිඥ එම්. යූ. එම්. අලි සබ්රි,
මුදල් අමාත්‍ය.

2022 අප්‍රේල් මස 29 වැනි දින,
කොළඹ 01,
මුදල් අමාත්‍යාංශයේ දී ය.